**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120
ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635
දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)
වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk
ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk

---

මගේ අංකය / எனது இலக்கம் / My NO — 1431 /2024
ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024
දිනය / திகதி / Date — 04/09/2024 පැය 1840

# මාධ්‍ය නිවේදනය

## මාරක රිය අනතුරක් - එප්පාවල පොලිස් වසම.

2024.09.04 වන අද දින දහවල් කාලයේ එප්පාවල පොලිස් වසමේ තලාව කැකිරාව මාර්ගයේ කටියාව හන්දිය ආසන්නයේදී වෑන් රථයක් යතුරු පැදියක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදියේ ගමන්කළ කාන්තාවක් දෙදෙනෙකු හා වයස අවුරුදු 03 ½ ක පිරිමි දරුවෙකු තුවාල ලබා එප්පාවල රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව කාන්තාවන් දෙදෙනා මියගොස් ඇත. දරුවා වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහල වෙත මාරු කර යවා ඇත.

**මරණකාරියන් අවුරුදු 38 හා 58 වයස්වල පසුවන මළලැව, ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකාරියන් වේ.**

වෑන් රථයේ රියදුරුට නින්ද යාම හේතුවෙන් වෑන් රථය මාර්ගයෙන් ඉවතට පැන ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණි යතුරු පැදියේ ගැටීමෙන් මෙම අනතුර සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. වෑන් රථයේ රියදුරු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර, ඔහු අනුරාධපුර පොලිසියට අනුයුක්ත පොලිස් සැරයන් වරයෙකි. එප්පාවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**